[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 06 ශ්‍රේණිය | විෂයය - ඉතිහාසය | පත්‍රය I/II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ..............................................................................

### I කොටස

**අංක 01 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) මිනිසා විසින් පළමුවරට ගින්දර භාවිතා කළ බවට සාක්ෂි හමුවී ඇති රට කුමක්ද?
   1) ඉරාකය 2) ඊශ්‍රායලය 3) චීනය 4) අරාබිය

2) මුහුණුවල දක්නට තිබෙන වෙනස්කම් අනුව අප්‍රිකානු ප්‍රදේශවල ජීවත්වන ජනවර්ගය පහත පිළිතුරු අතරින් තෝරන්න.
   1) නීග්‍රොයිඩ් 2) මොන්ගොලොයිඩ්
   3) ඔස්ට්‍රලොයිඩ් 4) කොකසොයිඩ්

3) වෘත්තයට අංශක 360 ක් ඇතිබව ලෝකයට ප්‍රථම වරට ප්‍රකාශ කළේ කුමන ශිෂ්ටාචාරය ද?
   1) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය 3) ඉන්දුනිම්න ශිෂ්ටාචාරය
   2) ඊජිප්තු ශිෂ්ටාචාරය 4) චීන ශිෂ්ටාචාරය

4) ලෝකයේ පැරණිතම නීති පොත රචනා කර ඇත්තේ,
   1) ගිල්ගමේෂ් විසිනි 2) හමුරාබි විසිනි
   3) පාරාවෝ රජදරුවන් විසිනි 4) අක්හෙනතන් රජු විසිනි

5) මිනිසකු වීමට නැඹුරු වූ පැරණිතම වානරයා,
   1) ඔස්ට්‍රලෝපිතිකස් ය 3) හෝමෝඉරෙක්ටස් ය
   2) හෝමෝහැබිලස් ය 4) හෝමෝසාපියන් ය

6) අප ආහාරයට ගන්නා වී මුල්වරට වගා කරන ලද්දේ මින් කුමන ප්‍රදේශයක ද?
   1) මධ්‍යධරණී ප්‍රදේශයේ 2) චීනයේ
   3) මධ්‍යම මෙක්සිකෝවේ 4) කැනඩාවේ

7) ක්‍රි.පූ.3000 ට අයත් වූ මැටියෙන් තැනූ දෑකැත්තක් භාවිතා කරන ලද්දේ කුමන යුගයක දී ද ?
   1) පුරාශිලා යුගය 2) නවශිලා යුගය
   3) මධ්‍යශිලා යුගය 4) වර්තමාන යුගය

8) ශිෂ්ටාචාර ආරම්භවීමට පෙර සමාජය තුළ දුප්පත් හා පොහොසත් වශයෙන් දෙපිරිසක් බිහිවීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,
   1) අධ්‍යාපන මට්ටමේ ඇතිවූ වෙනස්කම් නිසා ය
   2) ඉදිකරගත් නිවාසවල තිබූ විශාලත්වය මතය
   3) අනුගමනය කළ සිරිත් විරිත් නිසා ය
   4) අස්වැන්න ලබා ගැනීමේ තිබූ වෙනස්කම් නිසා ය

9) ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තිය සිදුවීමට පෙර කාලය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
   1) ක්‍රිස්තු පූර්ව නමිනි 2) ක්‍රිස්තු වර්ෂ නමිනි
   3) බුද්ධ වර්ෂ නමිනි 4) ශක වර්ෂ නමිනි

10) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පිහිටා ඇති ගංගා නිම්න දෙක වන්නේ,
   1) ඉන්දු ගඟ හා ගංගා නම් ගඟ 2) හොවැංහෝ ගඟ හා යැංසි ගඟ
   3) යුප්‍රටීස් හා ටයිග්‍රීස් ගංගා 4) නයිල් ගඟ හා ක්‍රිෂ්ණා ගඟ



LIVEWORKSHEETS

11) විජය කුමරු ඇතුළු පිරිස ගොඩබසින ලද තැන ලෙස සැලකෙන්නේ,
1) මාතොට
2) තම්බපණ්ණිය
3) ත්‍රිකුණාමලය
4) ගොඩවාය

12) පහත (A) තීරයේ දැක්වෙන ස්මාරක අපට හමුවන ශිෂ්ටාචාරයන් (B) තීරයේ දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| (I) සෙල්ලම් මැටි කරත්තය | (a) ඊජිප්තුව |
| (II) පිරමීඩ | (b) මෙසපොතේමියාව |
| (III) කූනාය අක්ෂර | (c) ඉන්දු නිම්න |

1) a,b,c
2) c,b,a
3) b,a,c
4) c,a,b

13) මම්කරණය ලොවට දායාද කරන ලද්දේ ,
1) ඊජිප්තු වැසියන් විසිනි
2) මෙසපොතේමියානුවන් විසිනි
3) ඉන්දු නිම්න වැසියන් විසිනි
4) රෝම වැසියන් විසිනි

14) ගල් යුගයේ මිනිසුන් විසින් සිදු **නොකරන ලද** කාර්යයක් වූයේ,
1) කැලයේ වෙසෙන සතුන් දඩයම් කිරීම
2) ගල් මෙවලම් වැඩිපුර භාවිත කිරීම
3) මියගිය තම නෑදෑයන් සඳහා අවමංගල චාරිත්‍ර ඉටු කිරීම
4) වී වගා කොට බත් ආහාරයට ගැනීම

15) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගරයක් **නොවන්නේ**,
1) ගීසා
2) මෙහෙන්ජෝදාරෝ
3) හරප්පා
4) ධොලවීර

16) • දීඝ ගාමිණී කුමරු හා චිත්‍රා කුමරිය පියා සහ මව විය.
• පණ්ඩුල නම් බ්‍රාහ්මණයකුගෙන් අධ්‍යාපනය ලැබීය.
• ප්‍රථම වරට අනුරාධපුරය අගනගරය කර ගනිමින් රජ බවට පත්විය.

ඉහත විස්තරය මඟින් කියැවෙන රජතුමා කවුරුන් ද?
1) දේවානම්පියතිස්ස රජතුමා
2) පණ්ඩුකාභය රජතුමා
3) දුටුගැමුණු රජතුමා
4) වලගම්බා රජතුමා

17) මෙරට වාසය කළ යක්ෂ ගෝත්‍රික කණ්ඩායම්වලට අයත් නගරයක් වන්නේ මින් කුමක්ද?
1) අනුරාධපුරය
2) ලංකාපුරය
3) මාගම
4) ලංකා පටුන

18) විජය කුමරු සමඟ ලංකාවට පැමිණි පිරිස ගම්මාන පිහිටුවාගත් ගංගා නිම්නය කුමක් ද?
1) මල්වතු ඔය
3) කලු ගඟ
2) මහවැලි ගඟ
4) කැළණි ගඟ

19) පහත A හා B අතර ඇති සම්බන්ධය ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| I. කයිරෝ නගරය | A දෙවියන්ට පුද පූජා පැවැත්වූ දේවාල |
| II.සිගුරට් | B නයිල් ගංගා නිම්නය |
| III.ඊජිප්තුව | C වෙළඳාමේ දක්ෂයන්ය |
| IV.ඇසිරියන්වරු | D ගීසා පිරමීඩ |

1) DCBA
2) DABC
3) BACD
4) BCDA

20) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන ගංගාවකි,
1) නයිල් ගඟ
2) හොවැංහෝ ගඟ
3) ඉන්දු ගඟ
4) යුප්‍රටීස් ගංගාව

**(ලකුණු 2× 20 = 40)**



LIVEWORKSHEETS